# 9 ශ්‍රේණිය

## ගමයි පන්සලයි
## වැවයි දාගැබයි

❖ අප ශ්‍රී ලංකා දීපය තුළ ආගමික, සාමාජික, සංස්කෘතික නවෝදයක් ඇති වූයේ බුදුන් රදුන් පිරිනිවන් පා අවුරුදු 236 කට පසු මිහිදු හිමියන්ගේ ආගාමනයත් සමගයි.

❖ මිහිදු හිමි දේශිත බුද්ධ ධර්මයේ ආර්ථික දැක්මත් නිසා ඇති වූ සංස්කෘතික නවෝදය නිසා ප්‍රකට වූ සංකල්පය **ගමයි පන්සලයි වැවයි දාගැබයි** යන්නයි.



❖ මිහිදු හිමිගෙන් ලැබුණු දායාදයක් ලෙස, වාස්තුවිද්‍යාත්මක වශයෙන් ඉහළ වටිනාකමක් ඇති වාපි නොහොත් වැව හැඳින්විය හැක. අතීතයේ පැවති රුහුණු, පිහිටි, මායා යන තුන් සිංහලයේ ම ආවරණය වූයේ ස්ථිරසාර වාරි පද්ධතියක් අපේ මුතුන් මිත්තන් විසින් ඉදි කෙරිණි. මහ සයුර වැනි වැව් ඉදි වූයේ ලොව මවිත කරමිනි.

❖ වාපි සංස්කෘතියත් බෞද්ධ සංස්කෘතියත් අතර ඇත්තේ සමීප සම්බන්ධතාවකි. මේ දෙක ම එකිනෙකින් පෝෂණය වී තිබේ. මහා සාගරය වැනි වැව් ඉදිකිරීම සඳහා මුලික වූයේ රජවරු හා ප්‍රභූවරුන්ය. වැව් ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූයේ ආර්ථික

සංවර්ධනය යි. එමගින් දැහැමි දිවිපෙවතක්, දැත දෙපය වැර වීර්යයෙන් අවශ්‍යතා ඉටුකර ගත් හ.



- ශ්‍රී ලංකිකයන් ගේ අනන්‍යතාවය ලොවට ප්‍රකාශ කරන සංකේතයක් ලෙස දාගැබ හැදින්විය හැක.
- වැව උපයෝගී කරගෙන ආර්ථික දියුණු ව ලබා ගත් මිනිස්සු අධ්‍යාත්මික කැඩපත ලෙස දාගැබ හැදින්විය හැක.
- වැව ඉදිකිරීමේ දී ඉවත් කෙරෙන පස් භාවිතයෙන් ගඩොල් සාදා දාගැබ තනා ඇත.
- සැදැහැවතුන් දාගැබ ප්‍රදක්ෂිණා කිරීමෙන් බලාපොරොත්තු වූයේ බුදුන් රදුන්ට සිදු කරන පූජාවක් ලෙසිනි



- වැවෙත් දාගැබෙත් ආශිර්වාදය ඔස්සේ වැවට ආසන්නයේ ඉදි වූයේ ගම හා පන්සලයි.
- ගමේ මුදුන් මල් කඩ වන්නේ පන්සලයි.

➢ ගම්වාසීන් තම ජීවන රටාව දැහැමින් ගෙනියන්නේ භික්ෂූන්ගේ අවවාද අනුශාසනා පරිදි ය.



- ගමත් පන්සලත් අතර ඇත්තේ අඛණ්ඩ සම්බන්ධතාවකි.
- රාජ රාජ මහාමාත්‍ය වරුන්ට පවා අනුශාසනා දෙන භික්ෂූන් ගමේ ජනතාවගේ ආධ්‍යාත්මය දියුණු කිරීමට මූලිකත්වය ගෙන ක්‍රියා කළේ ය.
- වැවයි දාගැබයි ගමයි පන්සලයි සංකල්පය තුළ ලක්වැසියන් ඉතා සමගි සම්පන්න ජාතියක් ලෙස ලොවට පෙන්වා දුන් හ.
- වැව උපයෝගී කරගෙන කෘෂිකර්මාන්තයේ යෙදුනේ සමූහිකත්වය, කයිය අත්තම තුළින් සනාථ වේ. තම කුඹුරේ සහයට පැමිණි සියල්ලන්ට ම බත බුලතින් සංග්‍රහ කළේ ඉතා සතුටිනි.

- වැවත් දාගැබත් ඔස්සේ ලක්වැසියන් ගේ සාරධර්ම මැනවින් ආරක්ෂා විය.
- ආයුධ, වස විස, සත්ත්ව වෙළදාම් වැනි ජීවිතය අදූරු කරන රැකියා වලින් ඉවත් වී දැත දෙපය වෙර වීර්යයෙන් දැහැමි ව තම ජීවන රටාවට හුරු වුයේ මෙම සංකල්පය නිසා ය.
- ලොව කිසිම රටක දක්නට නොලැබෙන මෙම සංකල්පයෙන් සාමය හා සහජීවනයෙන් ක්‍රියා කර ඇති අයුරු ඉතා ප්‍රශංසනී යයි.

# ප්‍රශ්න

1. බෞද්ධ සංස්කෘතියට අනුව ගම්වාසින් තම ජීවිත හැඩගස්වා ගැනීමට උපදෙස් ලබාගත්තේ කාගෙන්ද?
2. පැරැන්නන් ගමේ මුදුන් මල්කඩ ලෙස සැලකුවේ කුමන ස්ථානයද?
3. විහාරස්ථානයක පවතින ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.
4. අතීතයේදී ගමේ විහාරස්ථානය ආගමික මධ්‍යස්ථානයකට අමතරව භාවිත වූයේ කුමක් සදහාද?
5. බුදුරදුන්ගේ ශාරීරික ධාතුන් වහන්සේලා තැන්පත් චෛත්‍ය දෙකක් නම් කරන්න?
6. අනුරාධපුරයේ පවතින වැව් දෙකක් නම් කරන්න.
7. ධාර්මික රැකියා මොනවාද?
8. සාරධර්ම යනු මොනවාද? කෙටියෙන් දක්වන්න.